# 2021 THEORY
# අයනික සමතුලිතතාවය - 01

## ව්‍යුහගත රචනා

**01. (a)** මෙතිල්ඇමීන්, $CH_3NH_2$ දුබල භස්මයක් වේ. මෙතිල්ඇමීන් හි ජලීය ද්‍රාවණයක පහත සමතුලිතතාව පවතී.

$$CH_3NH_2(aq) + H_2O(l) \rightleftharpoons CH_3NH_3^+(aq) + OH^-(aq)$$

**i)** මෙතිල් ඇමීන් හි Kb සඳහා ප්‍රකාශනය ලියන්න.

______________________________________________

______________________________________________

______________________________________________

**ii)** $25^0C$ දී 0.20 $moldm^{-3}$ මෙතිල්ඇමීන් ජලීය ද්‍රාවණයක pH අගය 11.00 වේ. $K_b$ ගණනය කරන්න.

______________________________________________

______________________________________________

______________________________________________

______________________________________________

**iii)** ඉහත (ii) හි ද්‍රාවණයෙන් 25.00 $cm^3$ පරිමාවක් 0.20 mol $dm^{-3}$ HCl සමඟ $25^0C$ දී අනුමාපනය කරන ලදි. සමකතා ලක්ෂ්‍යයේ දී ද්‍රාවණයේ pH අගය ගණනය කරන්න. ($25^0C$ දී $K_w = 1.0 \times 10^{-14}$ $mol^2dm^{-6}$)

______________________________________________

______________________________________________

______________________________________________

______________________________________________

______________________________________________

## රචනා ප්‍රශ්න

**02. (a)** සාන්ද්‍රණය 0.2 mol $dm^{-3}$ වන ජලීය ඇමෝනියා ද්‍රවණයක විඝටන ප්‍රමාණය 1 x $10^{-3}$ වේ.මේ උෂ්ණත්වයේදී,

(i) $OH^-$ අයන සාන්ද්‍රණය සොයන්න. ii) $K_b$ ගණනය කරන්න.

**(b)** සාන්ද්‍රණය 3.0mol $dm^{-3}$ වන $CH_3NH_2$ ද්‍රවණයක ඇති $OH^-$ අයන සාන්ද්‍රණය $1.8x10^{-5}$mol $dm^{-3}$ වේ.මේ උෂ්ණත්වයේ දී,

(i) $CH_3NH_2$ හි විඝටන සොයන්න. ii) $CH_3NH_2$ හි $K_b$ ගණනය කරන්න

03. එක්තරා ද්‍රාවණයක $1.2 moldm^{-3}$ සාන්ද්‍රණයෙන් යුතුව HCl ද $0.1 mol\ dm^{-3}$ සාන්ද්‍රණයෙන් යුතුව $CH_3COOH$ අම්ලය ද පවතී. $25^0C$ දී $CH_3COOH$ හි විඝටන නියතය $1.8x10^{-5}$ $moldm^{-3}$ නම් එම ද්‍රාවණයේ pH අගය සොයන්න.

04. (a) $25^oC$ දී $RNH_2$ හි $K_b = 4.0 \times 10^{-4}$ $mol\ dm^{-3}$ වේ. එම උෂ්ණත්වයේදී ජලය 0.01 $moldm^{-3}$ වන $RNH_2$ ජලීය ද්‍රවණයක,

(i) $25^oC$ දී $OH^-$ අයන සාන්ද්‍රණය ගණනය කරන්න.

(ii) $25^oC$ දී $H^+$ අයන සාන්ද්‍රණය ගණනය කරන්න.

(b) ජලීය $H_2CO_3$ ද්‍රවණයක 0.02 $mol\ dm^{-3}$ වේ. අදාල උෂ්ණත්වයේදී $H_2CO_3$ සඳහා $K_{a1} = 4.30 \times 10^{-7}$ $mol\ dm^{-3}$ ; $K_{a2} = 5.60 \times 10^{-11}$ $mol\ dm^{-3}$ මේ උෂ්ණත්වයේදී $H_2CO_3$ හි ජලීය ද්‍රාවණයක් තුළ

(i) $HCO_3^-$ අයන සාන්ද්‍රණය ගණනය කරන්න.

(ii) $CO_3^{2-}$ අයන සාන්ද්‍රණය ගණනය කරන්න.

05. සාන්ද්‍රණය 0.05 $moldm^{-3}$ සෝඩියම් එතනොඒට් ජලීය ද්‍රාවණයක $25^0C$ දී PH අගය 9.0 වේ.

(i) ඉහත නිරීක්ෂණය තුලින් සමීකරණයක් මඟින් නිදහා දක්වන්න.

(ii) ජලීය ද්‍රාවණයේදී එතනොඒට් ඇනායනයේ විඝටන නියතය සඳහා ප්‍රකාශණයක් ලියන්න.

(iii) ඉහත විඝටන නියතය ගණනය කරන්න.

(iv) ඉහත විඝටන නියතය භාවිතා කර 0.05 $moldm^{-3}$ $CH_3COOH$ ජලීය ද්‍රාවණයක $25^0C$ දී නිවැර දි $P^H$ අගය ගණනය කරන්න.

(v) $P^H$ අගය 8.724 ක් වූ ද්‍රාවණ 1 $dm^3$ ක් දැමීමට 0.01$moldm^{-3}$ $CH_3COOK$ yd 0.01$moldm^{-3}$ $(CH_3COO)_2Ca$ පමණක් මිශ්‍ර කරයි. අවශ්‍ය 0.01 $moldm^{-3}$ $CH_3COOK$ පරිමාව ගණනය කරන්න.

($K_w = 1 \times 10^{-14} mol^2 dm^{-6}$)

06. එක්තරා ද්‍රාවණයක 0.02 $mol\ dm^{-3}$ සාන්ද්‍රණයෙන් යුතුව නයිට්‍රික් (v) අම්ලය ද 0.01 $mol\ dm^{-3}$ සාන්ද්‍රණයෙන් යුතුව එතනොයික් අම්ලය ද පවතී.
298 K දී $CH_3COOH$ හි $Ka = 1.8 \times 10^{-5}$ $mol\ dm^{-3}$ නම් $CH_3COOH$ හි විඝටන ප්‍රමාණය ද ද්‍රාවණයේ pH අගය ද සොයන්න.

07. (a) (i) ස්වාරක්ෂක ද්‍රාවණයක් යනු කුමක් ද ?

(ii) ජීව පද්ධති සම්බන්ධයෙන් ස්වාරක්ෂක ද්‍රාවණ වල වැදගත්කම පහදා දෙන්න.

(b) (i) $NH_4Cl/NH_4OH$ පද්ධතියේ ස්වාරක්ෂක ක්‍රියාව පැහැදිලි කරන්න.

(ii) $CH_3COOH / CH_3COONa$ පද්ධතියට උෂ්ණත්වය වෙනස් නොවන පරිදි ජලය එකතු කර තනුක කිරීමේදී $P^H$ අගය වෙනස් නොවී පවතින්නේ කෙසේදැයි පැහැදිලි කරන්න.

(iii) ජලීය $NaHCO_3$ ද්‍රාවණයක් ස්වාරක්ෂක ක්‍රියාව දැක් වුවද ජලීය $NaHSO_4$ ද්‍රාවණයක් ස්වාරක්ෂක නොවන්නේ ඇයිදැයි පැහැදිලි කරන්න.

(iv) රුධිරයේ ස්වාරක්ෂක හැසිරීම පැහැදිලි කරන්න.

08. $25^0C$ දී එතනොයික් අම්ලයට සාපේක්ෂව සාන්ද්‍රණය 0.01 $mol\ dm^{-3}$ වූ ද සෝඩියම් එතනොඒට් වලට සාපේක්ෂව සාන්ද්‍රණය 0.005 $mol\ dm^{-3}$ වූ ද ජලීය ද්‍රාවණයක pH අගය සොයන්න. 25 $^0C$ දී $CH_3COOH$ හි විඝටනය නියතය,Ka $1.8 \times 10^{-5}$ $mol\ dm^{-3}$ වේ.

09. මිනිසාගේ කොඳු ඇට පෙළෙහි ඇති දියරයේ pH අගය 7.53 වන අතර රුධිරයේ pH අගය 7.36 වේ. රුධිරයේ ඇති හයිඩ්‍රජන් අයන සාන්ද්‍රණය කොදු ඇට පෙළෙහි ඇති දියරයේ වූ හයිඩ්‍රජන් අයන සාන්ද්‍රණය මෙන් කී ගුණයක් වේ ද? මෙන් කී ගුණයක් වේ ද?

10. 27 $^{0}C$ දී PH අගය 1.5 වන ජලීය ද්‍රාවණයක් ලබා ගැනීම සඳහා ජලය 500 $cm^3$ ක් තුළ දිය කළ යුතු HCl වායු පරිමාව කවරේ ද ? 27 $^{0}C$ දී වායුවේ පීඩනය 1 x $10^5$ Pa යැයි ද මෙම තත්ත්ව යටතේ එය පරිපූර්ණ වායුවක් ලෙස හැසිරේ යැයි ද සලකන්න.

11. එක්තරා ජලීය ද්‍රාවණයක් 25$^{o}C$ දී HCl g සාපේක්ෂව සාන්ද්‍රණය 0.1 mol $dm^{-3}$ වන අතර HA g සාපේක්ෂව සාන්ද්‍රණය 0.10 mol $dm^{-3}$ වේ. 25$^{o}C$ දී HA හි $K_a$= 2.0 x $10^{-5}$ mol $dm^{-3}$වේ. 25$^{o}C$ දී $K_W$ = 1.0x$10^{-14}$$mol^2$ $dm^{-6}$ වේ.

i 25$^{o}C$ දී උක්ත ද්‍රාවණය තුළ HA හි විඝටන ප්‍රමාණය ගණනය කරන්න.

ii 25$^{o}C$ දී උක්ත ද්‍රාවණය H අයන සාන්ද්‍රණය ගණනය කරන්න.

iii 25$^{o}C$ දී උක්ත ද්‍රාවණයේ $OH^-$ අයන සාන්ද්‍රණය ගණනය කරන්න.

12. (a) ජලීය ද්‍රවණයේදී $NH_3$ හි $K_b$ අගයත් $NH^+_4$ අගයත් අතර ඇති සම්බන්ධතාවය ව්‍යුත්පන්න කරන්න.

(b) 25$^{o}C$ දී ඒක-භාස්මික ඉතා දුබල අම්ලයක ජලීය ද්‍රාවණයක සාන්ද්‍රණය 0.10 mol dm වේ.

25$^{o}C$ දී $K_a$= 9.0 x $10^{-9}$ mol $dm^{-3}$ ; 25$^{o}C$ දී $K_w$= 1.0 x $10^{-14}$ $mol^2$ $dm^{-6}$

(i) 25$^{o}C$ දී දුබල අම්ලය විඝටන ප්‍රමාණය සොයන්න.

(ii) 25$^{o}C$ දී මෙම ජලීය ද්‍රාවණයේ $H_3O^+$ අයන සාන්ද්‍රණය සොයන්න.

(iii) 25$^{o}C$ දී මෙම ජලීය ද්‍රාවණයේ $OH^-$ අයන සාන්ද්‍රණය සොයන්න.

13. (i) HA යන දුබල අම්ලයේ විඝටන නියතය ($K_a$) පරීක්ෂණාත්මකව සොයාගන්නේ කෙසේදැයි විස්තර කරන්න.

(ii) HA යන ඉතා දුබල අම්ලයක ජලීය ද්‍රාවණයක් තුළ ඇති අම්ලයෙන් 50% ක් උදාසීන වන සේ ජලීය NaOH එකතු කරන ලදී. මෙයින් ලැබෙන ද්‍රාවණයේ $P^H$ අගය 25$^{o}C$ දී 4.9 ක් විය. 25$^{o}C$ දී HA යන දුබල අම්ලයේ විඝටන නියතය ($K_a$) ගණනය කරන්න.

14. (i) 0.10 mol $dm^{-3}$ NaOH ද්‍රාවණයකින් 50.00$cm^3$ ක්, දුබල ඒක භාෂ්මික ද්‍රාවණ 25.00$cm^3$ සමඟ මිශ්‍ර කරන ලදී. එවිට මිශ්‍රණයේ $P^H$ අගය 11.0 බව සොයා ගන්නා ලදී. දුබල අම්ල ද්‍රාවණයේ සාන්ද්‍රණය ගණනය කරන්න.

(ii) 0.10 mol $dm^{-3}$ NaOH ද්‍රාවණයෙන් 20.00$cm^3$ ක් ඉහත දුබල අම්ල ද්‍රාවණයෙන් 25.00$cm^3$ සමඟ මිශ්‍ර විට මිශ්‍රණයේ $P^H$ අගය 4.0 විය. දුබල අම්ලයේ විඝටන නියතය ගණනය කරන්න.
ඉහත ගණනය කිරීම්වල දී ඔබ යම් උපකල්පන භාවිතා කළේ නම් ඒවා සඳහන් කරන්න.

15. (a) (i) ජලීය HOOC $CH_2$ $CH_2$ $CH_2$ $CH_2$ COOK ද්‍රාවණයක් ස්වාරක්ෂක ක්‍රියාව දක්වයි. මෙය පැහැදිලි කරන්නේ කෙසේදැයි දක්වන්න.

(ii) 0.2mol $dm^{-3}$ $H_2SO_4$ ද්‍රාවණයකින් 50$cm^3$ ක් 0.8mol $dm^{-3}$ $CH_3$ COOONa ද්‍රාවණයකින් 50$cm^3$ ක් සමග මිශ්‍ර කළ විට ලැබෙන ද්‍රාවණයකට ස්වාරක්ෂක ගුණ පවතින බව ශිෂ්‍යයෙක් නිර්ණය කරන ලදී. උචිත රසායනික සමීකරණ සහ ගණනය කිරීම් සමග ඉහත සඳහන් නිරීක්ෂණ පහදන්න.

(b) (i) HA යන දුබල අම්ලයේ විඝටන නියතය ($K_a$) පරීක්ෂණාත්මකව සොයාගන්නේ කෙසේදැයි විස්තර කරන්න.

(i) HA යන ඉතා දුබල අම්ලයක ජලීය ද්‍රාවණයක් තුළ ඇති අම්ලයෙන් 50% ක් උදාසීන වන සේ ජලීය NaOH එකතු කරන ලදී. මෙයින් ලැබෙන ද්‍රාවණයේ $P^H$ අගය 25$^{o}C$ දී 4.9 ක් විය. 25$^{o}C$ දී HA යන දුබල අම්ලයේ විඝටන නියතය ($K_a$) ගණනය කරන්න.

16. ශරීරය තුළ ඇති ද්‍රවයන්ගේ pH අගය නියතව තබාගැනීම සඳහා $CO^{2-}_3$ , $HCO^-_3$ සහ $CO_2$ හේතු වේ. 298 K දී $H_2CO_3$ වල ප්‍රථම සහ දෙවැනි විඝටන නියත පිළිවෙලින් $4.2\times10^{-7}moldm^{-3}$ හා $4.7\times10^{-11}$ $moldm^{-3}$ වේ. ඉහත කී සංඝටක නොයෙකුත් ප්‍රමාණවලින් පවතින ද්‍රාවණ සම්බන්ධයෙන් අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න. (උෂ්ණත්වය 298 K යැයි සලකන්න).

i. $Ka_1$ හා $Ka_2$ ට අදාළ ප්‍රතික්‍රියා සඳහා තුලිත සමීකරණ ලියන්න.

ii. පහත අවස්ථාවලදී ද්‍රාවණයේ pH අගයන් සොයන්න.

I. 298K දී $CO_2$වලින් සංතෘප්ත කරන ලද ද්‍රාවණයක $H_2CO_3$ සාන්ද්‍රණය $0.033moldm^{-3}$ වන විට,

II. $H_2CO_3$ හා $HCO^-_3$ මවුල අනුපාතය 1 : 1 වන ජලීය ද්‍රාවණයක,

III. $HCO^-_3$ හා $CO_3^{2-}$ මවුල අනුපාතය 1 : 1 වන ජලීය ද්‍රාවණයක,

IV. $CO_3^{2-}$ සාන්ද්‍රණය 0.125 $moldm^{-3}$ වන ජලීය ද්‍රාවණයක

iii. රුධිර ප්ලාස්මාවේ pH අගය 7.40 වේ. මෙම pH අගයේදී හොඳම ස්වාරක්ෂක ක්‍රියාව දක්වන පද්ධතියට අදාළ සංඝටක සඳහන් කර ඒවායේ මවුල අනුපාතය සොයන්න.

iv. $Ka_1$අගය සඳහන් කර ඇත්තේ ජලයේ දිය වන සියලුම $CO_2$, $H_2CO_3(aq)$ ආකාරයෙන් පවතින්නේ යැයි උපකල්පනය කිරීමෙනි. එහෙත් $CO_2(aq)+H_2O(l) \rightleftharpoons H_2CO_3\ (aq)$ යන අමතර සමතුලිතතාවයක්ද? පවතින්නේ යැයි සොයාගෙන ඇත. ඒ අනුව $H_2CO_3$ වල සත්‍ය සාන්ද්‍රණය සැලකිල්ලට ගත් විට $Ka_1 = 2 \times 10^{-4}$ mol $dm^{-3}$ වේ. මේ දත්ත භාවිතයෙන් ජලයේ දිය වූ $CO_2$ වලින් $H_2CO_3$ බවට පත් වී ඇති ප්‍රතිශතය සොයන්න.

17. a) HA නැමැති ඒකභාස්මික දුර්වල අම්ලයෙන් හා එහි සෝඩියම් ලවණයෙන් සමන්විත ස්වාරක්ෂක ද්‍රාවණයක pH අගය $pH = pK_a + \log_{10}\frac{[A^-(aq)]}{[HA(aq)]}$ මගින් ලබාදෙන බව පෙන්වන්න.

b) 0.20 $moldm^{-3}$ NaOH ද්‍රාවණයක 20 $cm^3$ කට $CH_3COOH$ ද්‍රාවණයකින් 50.0$cm^3$ ක් එක්කරයි.

i. පරිමා විපර්යාසයක් සිදු නොවේ නම් ලැබෙන ද්‍රාවණයේ pH අගය සොයන්න.

ii. මේ ද්‍රාවණයේ pH අගය 4.74 දක්වා වෙනස් කිරීම සඳහා අමතරව එක්කළ යුතු NaOH ස්කන්ධය කවරේද? (අදාළ උෂ්ණත්වයේදී $K_a\ (CH_3COOH) = 1.8\times10^{-5}\ moldm^{-3}$)

18. යම් උෂ්ණත්වයක දී 0.1 mol $dm^{-3}$ $CH_3COOH$ ද්‍රාවණයක විඝටන ප්‍රමාණයම ඇති $HNO_2$ ද්‍රාවණයක සාන්ද්‍රණය කවරේ ද? අදාළ උෂ්ණත්වයේ දී $CH_3COOH$ හා $HNO_2$ වල විඝටන නියත පිළිවෙලින් $1.8 \times 10^{-5}$ mol $dm^{-3}$ සහ $4 \times 10^{-4}$ mol $dm^{-3}$ වේ.

19. 0.02 mol $dm^{-3}$ $CH_3COOH$ ද්‍රාවණයකින් 75$cm^3$ ප්‍රමාණයක් ගෙන එයට 1.5 $moldm^{-3}$ NaOH 10$cm^3$ එකතු කර සමස්ත පරිමාව 100$cm^3$ වනතෙක් ඇසෘත ජලය යොදන ලදි. අදාල උෂ්ණත්වයේදී $CH_3COOH$ හි $Ka= 1.8\times 10^{-5}$ $moldm^{-3}$ වේ. $25^0C$ දී ජලයේ $Kw = 1.0 \times 10^{-14} moldm^{-6}$ වේ.

(i) ද්‍රාවණයේ $CH_3COO\text{-}Na^+$ සාන්ද්‍රණය ගණනය කරන්න.

(ii) ද්‍රාවණයේ තුල $OH^-$ සාන්ද්‍රය ගණනය කරන්න.

(iii) ද්‍රාවණයේ $25^0C$ දී pH අගය ගණනය කරන්න.

(iv) ද්‍රාවණය තුල ජලවිච්ඡේදනය ප්‍රතිශතය ගණනය කරන්න.

20. 298 K දී $CH_3COONa$ වලට සාපේක්ෂව සාන්ද්‍රණය 0.10 mol $dm^{-3}$ වූ ද $CH_3COOH$ වලට සාපේක්ෂව සාන්ද්‍රණය 0.10 mol $dm^{-3}$ වූ ද ස්වාරක්ෂක ද්‍රාවණයක 500$cm^3$ කට 0.10 $moldm^{-3}$ NaOH ද්‍රාවණයකින් 10$cm^3$ ක් එක්කළ විට ද්‍රාවණයේ pH අගය කවර අගයක සිට කවර අගයක් දක්වා වෙනස් වේද?

298 K දී $K_a(CH_3COOH) = 1.8\times10^{-5}$ mol $dm^{-3}$

21. (i) ජලීය ද්‍රාවණයක පවතින ඉතා දුබල ඒක භාෂ්මික HA අම්ලයේ විඝටන නියතය $K_a$ සඳහා ප්‍රකාශණයක් ජලීය ද්‍රාවණයේ පවතින $H^+_{(aq)}$, $A^-_{(aq)}$ සහ $HA_{(aq)}$ සාන්ද්‍රණ පද ඇසුරින් ලියා දක්වන්න.

(ii) ඒ නයින් $pK_a = P^H - \log_{10} \frac{[A^-_{(aq)}]}{[HA^-_{(aq)}]}$ බව පෙන්වා දෙන්න. මෙහි $pK_a = -\log_{10} K_a$ වේ.

(iii) එක්තරා උෂ්ණත්වයකදී HA අම්ලයේ $2.00 \times 10^{-3}$ ජලයෙහි ද්‍රවණය කර එම ද්‍රාවණයේ පරිමාව $75.00\ cm^3$ තෙක් තනුක කරන ලදී. $0.04\ mol\ dm^{-3}$ NaOH ද්‍රාවණයක් $25.00 cm^3$ එම අම්ල ද්‍රාවණයට එකතු කළ විට, ලද ද්‍රාවණයේ $P^H$ අගය 6.0 විය. එම උෂ්ණත්වයේදී, HA අම්ලයේ විඝටන නියතය, $K_a$ ගණනය කරන්න.

22. පිහිනුම් තටාකවල ඇති ජලයේ $P^{H-}$ අගය 7-8 අතර අගයක පවත්වා ගත යුතුවේ. මේ සඳහා ස්වාරක්ෂක ද්‍රාවණයක් ලෙස ක්‍රියාකරන NaHCO ද්‍රාවණයක් එකතු කරනු ලැබේ.

(i) ස්වාරක්ෂක ද්‍රාවණයක් යනුවෙන් අදහස් වන්නේ කුමක්දැයි පැහැදිලි කර, $NaHCO_3$ හි ස්වාරක්ෂක ක්‍රියාව පහදා දෙන්න.

(ii) එකල පිහිනුම් තටාකවල $P^{H-}$ අගය වැඩිවීම පාලනය කිරීමට එකතු කරන ලද්දේ ඇලුමිනියම් සල්ෆේට් ය. ඇලුමිනියම් සල්ෆේට් එකතු කිරීමේදී $P^{H-}$ අගය අඩුවන්නේ කෙසේදැයි පැහැදිලි කරන්න.

(iii) ජලීය ද්‍රාවණයේදී $HCO_3^-$ අයනයේ විඝටනයට නියතය ($K_a$) සඳහා ප්‍රකාශයක් ලියන්න.

(iv) ඒ නයින් $P^H = P^{ka} + \log_{10}\left(\frac{[CO_3^{2-}]}{[HCO_3^-]}\right)$ බව පෙන්වන්න. (මෙහි $P^{ka} = -\log_{10} K_a$ වේ.)

(iv) 30°C දී $HCO_3^-$ අයනයේ $P^{ka}$ අගය 10.3 වේ නම් $HCO_3^-$ Ka අගය සොයන්න.

(v) 30°C දී $[CO_3^{2-}] / [HCO_3^-]$ අනුපාතය 0.003 සිට 0.960 දක්වා වැඩිකළ විට තටාකයේ අඩංගු ජලයේ $P^H$ වෙනස්වීම ගණනය කරන්න.

(vi) ඉහත ද්‍රාවණ ස්වාරක්ෂක ක්‍රියාව කවර $P^{H-}$ අගයකදී වඩාත්ම කාර්යක්ෂමවේද?

23. a). B නමැති ඒක ආම්ලික දුර්වල භස්මයෙන්ද එහි සංයුග්මක අම්ලය වන $BH^+$ වලින් ද සමන්විත ස්වාරක්ෂක ද්‍රාවණයක pOH අගය,

$pOH = pK_b + \log_{10} \frac{[BH^+(aq)]}{[B(aq)]}$ මඟින් දෙන බව පෙන්වන්න.

b). i. 298 K දී $NH_3$ වලට සාපේක්ෂව සාන්ද්‍රණය $0.20\ moldm^{-3}$ වූද $(NH_4)_2SO_4$ වලට සාපේක්ෂව සාන්ද්‍රණය $0.10 moldm^{-3}$ වූ ද ස්වාරක්ෂක ද්‍රාවණයක pH අගය සොයන්න.

ii. ඉහත කී ස්වාරක්ෂක ද්‍රාවණයේ $65.0\ cm^3$ කට $0.10\ moldm^{-3}$ HCl $10.0\ cm^3$ ක් එක්කළ විට ද්‍රාවණයේ pH අගය කවරක් වේද? 298 K දී $K_b (NH_3) = 1.8 \times 10^{-5}\ mol\ dm^{-3}$

24. a) $CH_3COONa 0.2 moldm^3$ සාන්ද්‍රණයකින් සහ $0.2 moldm^{-3}$ $CH_3COOH$ සාන්ද්‍රණයකින් යුත් පද්ධතියක ස්වාරක්ෂක ද්‍රාවණයේ,

i) pH අගය සොයන්න. $Ka = 1.75 \times 10^{-5}\ moldm^{-3}$

ii) ස්වාරක්ෂක ධාරිතාව සොයන්න.

b) $CH_3COONa$ $0.02\ moldm^{-3}$ සාන්ද්‍රණයකින් සහ $CH_3COOH$ $0.02 moldm^{-3}$ ස්වාරක්ෂක ද්‍රාවණ මිශ්‍රණයක ස්වාරක්ෂක ධාරිතාව සොයන්න.

25. (i) සාන්ද්‍රණය $0.15 mol\ dm^{-3}$ වන ජලීය $NH_3$ ද්‍රාවණයක $ldm^{-3}$ කට ඝන $NH_3Cl$ මවුල 0.02 ද්‍රවණය කර සාදාගත් ද්‍රාවණයේ 25°C දී $P^H$ අගය සොයන්න.

(ii) සාන්ද්‍රණය $0.012\ mol\ dm^{-3}$ වන $NH_3$ COOK ද්‍රාවණයක $ldm^{-3}$ ක් තුළ $CH_3COOH$ මවුල 0.012 ක් ද්‍රවණය කර සාදාගත් ද්‍රාවණයේ 25°C දී $P^H$ අගය සොයන්න.

(iii) එක්තරා ජලීය ද්‍රාවණයක් සාදා ඇත්තේ $CH_3$ COOH සහ $CH_3$ COONa සම මවුල මිශ්‍ර කිරීමෙනි. $25^oC$ දී මේ ද්‍රාවණයේ $P^H$ අගය ගණනය කරන්න. $25^oC$ දී $CH_3$ COOH හි $K_a = 1.8 \times 10^{-5}$ mol $dm^{-3}$ වේ.

(iv) $25^oC$ $NH_3$ $K_b = 1.8 \times 10^{-5}$ mol $dm^{-3}$ වේ.

26. පහත A සහ B යන ස්වාරක්ෂක පද්ධතින් දෙක සලකන්න.

| | A | B |
|---|---|---|
| $[CH_3COOH]$ | = 0.2 moldm$^{-3}$, 100cm$^3$ | $[CH_3COOH]$= 0.02moldm$^{-3}$, 100cm$^3$ |
| $[CH_3COONa]$ | = 0.2moldm$^{-3}$, 100cm$^3$ | $[CH_3COONa]$ = 0.02moldm$^{-3}$, 100cm$^3$ |

මෙම පද්ධතින් දෙකේම $PK_a$ 4.745 වන අතර මෙම පද්ධතින් දෙකට පිටතින් 0.1moldm$^{-3}$ වන NaOH 5cm$^3$ බැගින් එකතු කරන විට

i) A ද්‍රාවණයේ නව pH අගය ගණනය කරන්න.

ii) B ද්‍රාවණයේ නව pH අගය ගණනය කරන්න.

iii) A සහ B ද්‍රාවන වලින් ස්වාරක්ෂක ධාරිතාව අඩු සහ වැඩි ද්‍රාවණ වේ

27. $CH_3COOH$ 0.15 mol ක් අඩංගු ද්‍රාවණයකට 0.25 mol dm$^{-3}$ NaOH ද්‍රාවණයකින් යම් පරිමාවක් එක්කළ විට මිශ්‍රණයේ අවසාන පරිමාව 375cm$^3$ ක් වන අතර pH අගය 4.45 විය.

i. $CH_3COONa$ වල අවසාන සාන්ද්‍රණය කවරේද?

ii. මුල් ද්‍රාවණයට එක්කර ඇති NaOH පරිමාව කවරේද?

iii. එතනොයික් අම්ල ද්‍රාවණයේ ආරම්භක සාන්ද්‍රණය කවරේද?

(අදාළ උෂණත්වයේදී $CH_3COOH$ හි විඝටන නියතය $1.8{\times}10^{-5}$ mol dm$^{-3}$ වේ)

28. (i) ජලීය ද්‍රාවණයක පවතින ඉතා දුබල ඒක භාෂ්මික HA අම්ලයේ විඝටන නියතය $K_a$ සඳහා ප්‍රකාශණයක් ජලීය ද්‍රාවණයේ පවතින $H^+_{(aq)}$, $A^-_{(aq)}$ සහ $HA_{(aq)}$ සාන්ද්‍රණ පද ඇසුරින් ලියා දක්වන්න.

(ii) ඒ නයින්

$$pK_a = P^H - \log_{10}\frac{[A^-_{(aq)}]}{[HA^-_{(aq)}]}$$

බව පෙන්වා දෙන්න. මෙහි $pK_a = -\log_{10} K_a$ වේ.

(iii) එක්තරා උෂ්ණත්වයක දී, HA අම්ලයේ $2.00\times 10^{-3}$ mol ජලයෙහි ද්‍රාවණය කර, එම ද්‍රාවණයේ පරිමාව 75.00cm$^3$ තෙක් තනුක කරන ලදී. 0.04 moldm$^{-3}$ NaOH ද්‍රාවණයක 25.00cm$^3$ එම අම්ල ද්‍රාවණයට එකතු කළ විට, ලද ද්‍රාවණයේ $P^H$ අගය 6.0 විය. එම උෂ්ණත්වයේ දී $H_a$ අම්ලයේ විඝටන නියතය $K_a$ ගණනය කරන්න.

29. a) ජලීය මාධ්‍යයේ දී, Ha ඒකභාෂ්මික අම්ලයෙහි අයනීකරණ නියතය $K_a$,25° දී 1.0x10$^{-5}$ moldm$^{-3}$ වේ.

i) 25°C දී, 0.100 moldm$^{-3}$ ජලීය HA ද්‍රාවණයක $P^H$ ගණනය කරන්න.

ii) $[H^3O^+(aq)]$ සහ Ka ඇසුරෙන්, $\frac{[HA(aq)]}{[(A-(aq)]}$ සඳහා සම්බන්ධතාවක් ව්‍යුත්පන්න කරන්න.

මෙහි $[H^3O^+ + (aq)]$, $[HA(aq)]$ සහ $[A^-(aq)]$ මගින්, ජලීය මාධ්‍යයේ සමතුලිත අවස්ථාවේ ඇති $H_3O^+$ හි, HA හි සහ $A^-$ හි සාන්ද්‍රණ පිළිවෙළින් නිරූපණය කෙරේ.

iii) ආරම්භක සාන්ද්‍රණය 0.100 mol dm$^{-3}$ වන HA ද්‍රාවණයට සුදුසු භෂ්මයක උචිත ප්‍රමාණයක් එකතු කිරීමෙන්, එහි pH 4.0 ලෙස පවත්වා ගන්නා ලදී. ඉහත (ii) හි දී ලබාගත් සම්බන්ධතාව උපයෝගී කර ගනිමින්, මේ අවස්ථාවේ දී $[HA(aq)]$ සහ $[A^-(aq)]$ ගණනය කරන්න.

iv) ඉහත (ii) කොටසෙහි ව්‍යුත්පන්න කරන ලද සම්බන්ධතාව උපයෝගී කරගනිමින්, ද්‍රාවණයෙහි $[HA(aq)] = [A^-(aq)]$ වන අවස්ථාවේ දී pH අගය ගණනය කරන්න.

v) ආරම්භක සාන්ද්‍රණය 0.0500 mol $dm^{-3}$ වන HA ද්‍රාවණ 55.00$cm^3$ ක්, ආරම්භක සාන්ද්‍රණය 0.0500 mol $dm^{-3}$ වන NaOH ද්‍රාවණ 50.00$cm^3$ ක් සමඟ මිශ්‍ර කළ විට ලැබෙන ද්‍රාවණයේ pH ගණනය කරන්න.

මෙම ගණනය කිරීමේ දී යම්කිසි උපකල්පන භාවිතකර ඇත්නම් ඒවා සඳහන් කරන්න.

30. a) HA සහ HB යන දෙකම දුර්වල අම්ල වන අතර එයින් වඩා ප්‍රබල අම්ලය වන්නේ HB ය.0.10$moldm^{-3}$ HB ද්‍රාවණයකින් V$cm^3$පරිමාවක් උදාසීන කිරීමට වැයවන 0.10$moldm^{-3}$ NaOH ද්‍රාවණපරිමාව 0.10$moldm^{-3}$HA ද්‍රාවණයකින් V$cm^3$ පරිමාවක් උදාසීන කිරීමට වැය වන 0.10 $moldm^{-3}$NaOH ද්‍රාවණ පරිමාවට වඩා වැඩි වේද? ඔබේ පිළිතුර පහදන්න.

b).එක්තරා ගිනිකඳු පිපිරීමකින් පසුව වැසි ජලයේ pH අගය 3.2 දක්වා අඩු වී තිබුණි. වැසි ජලයට ආම්ලිකතාවයක් ලැබෙන්නේ සල්ෆියුරික් අම්ලය නිසා පමණක් යැයි සලකා වැසි ජලයේ අඩංගු වන මුළු සල්ෆියුරික් අම්ල සාන්ද්‍රණය සොයන්න. සල්ෆියුරික් අම්ලයේ පළමු විඝටනය මුළුමනින් ම සිදුවන අතර දෙවැනි විඝටනය සඳහා විඝටන නියතය $Ka_2$ , $1\times10^{-2}$ $moldm^{-2}$ වේ.

31. 298K දී මෙතිල් ඇමීන් හි විඝටන නියතය, $K_b = 4.4\times10^{-4}$ mol $dm^{-3}$ වේ. 298 K දී 0.20 $moldm^{-3}$ $H_2SO_4$ ද්‍රාවණයකින් 50$cm^3$ ක් සහ 0.20$moldm^{-3}$ මෙතිල් ඇමීන් ද්‍රාවණයකින් 150$cm^3$ ක් හොඳින් මිශ්‍ර කරයි. පරිමා ආකලනය වේ නම් මිශ්‍රණයේ pH අගය සොයන්න.

32. $25^oC$ දී RCOOH යන ඒක භාස්මික දුබල අම්ලයේ විඝටන නියතය 2.5 x $10^{-5}$ mol $dm^{-3}$වේ. සාන්ද්‍රණය 0.16 mol $dm^{-3}$ වන ජලීය ද්‍රාවණයක $25^oC$ දී

i $H^+$ අයන සාන්ද්‍රණය ගණනය කරන්න. ii. විඝටන ප්‍රමාණය සොයන්න.

iii $OH^-$ අයන සාන්ද්‍රණය සොයන්න. ($25^oC$ දී $K_W$ = 1.0 x $10^{-14}$ $mol^2$ $dm^{-6}$ වේ.)

iv PH අගය සොයන්න.

33. ඇනිලීන් පහත දැක්වෙන අන්දමට ජලය සමඟ ප්‍රතික්‍රියා වේ.

$C_6H_5NH_2(aq) + H_2O(l) \rightleftharpoons C_6H_5N^+H_3(aq) + OH^-(aq)$

$25^0$ C දී 0.180 $moldm^{-3}$ ඇනිලීන් ද්‍රාවණයක අඩංගු $OH^-(aq)$ සාන්ද්‍රණය $8.80\times10^{-6}$ $moldm^{-3}$ වේ.

i. ඉහත ප්‍රතික්‍රියාවේ සමතුලිතා නියතය, $K_b$ සඳහා ප්‍රකාශනයක් ලියන්න.

ii. $25^0C$ දී $C_6H_5NH_2$ හි විඝටන නියතය $K_b$ ගණනය කරන්න.

iii. $25^0$දී $C_6H_5NH_2$ හි විඝටන ප්‍රතිශතය ගණනය කරන්න.

iv. $C_6H_5NH_2(aq) + H_3O^+(aq) \rightleftharpoons C_6H_5N^+H_3(aq) + H_2O(l)$ යන ප්‍රතික්‍රියාව සඳහා සමතුලිතතා නියතය සොයන්න

v. pH අගය 7.75 වන ද්‍රාවණයක් ලබා ගැනීම සඳහා තිබිය යුතු,

I. $\frac{[C_6H_5N^+H_3(aq)]}{[C_6H_5NH_2(aq)]}$ යන අනුපාතය සොයන්න.

II. මේ අනුපාතය පවත්වා ගැනීම සඳහා 0.180 $moldm^{-3}$ $C_6H_5NH_2$ ද්‍රාවණයක 250$cm^3$ කට එක්කළ යුතු 0.050 $moldm^{-3}$ HCl පරිමාව කවරේද ?

34. A සිට G තෙක් ද්‍රාවණ සඳහා සපයා ඇති විස්තර භාවිතයෙන් (i) – (iv) තෙක් ප්‍රශ්නවලට පිළිතුරු සපන්න.

| ද්‍රාවණය | විස්තරය |
|---|---|
| A | වසන ලද බෝතලයක ඇති අලුතෙන් ආසවනය කරන ලද ජලය |
| B | ජලීය 0.20 $moldm^{-3}$ HCl ද්‍රාවණයක් |
| C | ජලීය 0.10 $moldm^{-3}$ $CH_3COOH$ ද්‍රාවණයක් |

D ජලීය 0.01 moldm$^{-3}$ $CH_3COOH$ ද්‍රාවණයක්

E $CH_3COOH$ සාන්ද්‍රණය 0.10 moldm$^{-3}$ සහ $CH_3COONa$ සාන්ද්‍රණය 0.10 moldm$^{-3}$ වන ජලීය ද්‍රාවණයක්

F $CH_3COOH$ සාන්ද්‍රණය 0.10 moldm$^{-3}$ සහ $CH_3COONa$ සාන්ද්‍රණය 0.05 moldm$^{-3}$ වන ජලීය ද්‍රාවණයක්

G $CH_3COOH$ (විඝටන නියතය $K_1$) සාන්ද්‍රණය $C_1$ moldm$^{-3}$ සහ HCOOH ජලීය ද්‍රාවණයක් (විඝටන නියතය $K_2$) සාන්ද්‍රණය $C_2$ moldm$^{-3}$ වන ජලීය ද්‍රාවණයක්

i) A සහ E දක්වා ද්‍රාවණ. ඒවායේ PH අගය වැඩි වන අකාරයට සකස් කරන්න. පැහැදිලි කිරීමෙන් අවශ්‍ය නොවේ.

ii) E ද්‍රාවණය 10 ගුණයකින් තනුක කරන ලදි. එවිට එහි PH අගය වෙනස් විය හැකි ද ? ඔබේ පිළිතුරු කෙටියෙන් පැහැදිලි කරන්න.

iii) HCl අම්ල ද්‍රාවණයකින් කුඩා ප්‍රමාණයක් එක් කළ විට E සහ F ද්‍රාවණ දෙකෙන් කුමන ද්‍රාවණය pH අගයෙහි වෙනස් වීමට වැඩි ප්‍රතිරෝධයක් දක්වයි ද ? ඔබේ පිළිතුර කෙටියෙන් පැහැදිලි කරන්න.

iv) B ද්‍රාවණයෙන් 50.0cm$^3$ සහ C ද්‍රාවණයෙන් 50.0cm$^3$ මිශ්‍රකර I ද්‍රාවණය සාදන ලදි. I හි $P^H$ අගය කුමක් ද ? මෙම නිමානය සඳහා ඔබ භාවිතා කරන ලද උපකල්පන වෙතොත් ඒවා සඳහන් කරන්න. **(2008 A/L)**

**35.** 25$^0$C දී පිළියෙල කරන ලද පහත දී ඇති P, Q , R සහ S ද්‍රාවණ සලකන්න.

P : 0.056 moldm$^{-3}$ $CH_3COOH$ හි 100.0cm$^3$

Q : 0.056 moldm$^{-3}$ $CH_3COOH$ හි 50.0cm$^3$ ක සහ 0.200 moldm$^{-3}$ HCl හි 50.0cm$^3$ ක මිශ්‍රණය

R : 0.020 moldm$^{-3}$ HCl හි 50.0cm$^3$ ක සහ 0.022 moldm$^{-3}$ NaOH හි 50.0cm$^3$ ක මිශ්‍රණය

S : 0.056 moldm$^{-3}$NaOH හි 100.0cm$^3$

25$^0$C දී, $CH_3COOH$ හිවිඝටන නියතය, $K_a$ සහ ජලයෙහි අයනික ගුණිතය, $K_W$ පිළිවෙළින් $1.8 \times 10^{-5}$ moldm$^{-3}$ සහ $1.0\times 10^{-14}$mol$^2$dm$^{-6}$ වේ.

i) P ද්‍රාවණයෙහි Q ද්‍රාවණයෙහි සහ R ද්‍රාවණයෙහි PH ගණනය කරන්න.
එක් එක් ගණනය කිරීමේ දී ඔබ භාවිත කළ යම් උපකල්පන වෙතොත්, ඒවා සඳහන් කරන්න.

ii) P, Q, R සහ S යන ද්‍රාවණවලින් දෙකක් භාවිතා කර, ස්වාරක්ෂක ද්‍රාවණයක් සෑදිය හැකි ආකාරය දක්වන්න.
**(2010 A/L)**

**36.** i) සාන්ද්‍රණය C moldm$^{-3}$ වන ජලීය $CH_3COOH$ ද්‍රාවණයක $P^H$ සඳහා ප්‍රකාශනයක්, අම්ල විඝටන නියතය $K_a$ සහ c ඇසුරෙන් ව්‍යුත්පන්න කරන්න.

ii) ඉහත ව්‍යුත්පන්න කිරීමේ දී ඔබ කරන ලද උපකල්පන ලියන්න.

iii) ඉහත අම්ල ද්‍රාවණයෙහි 100.0cm$^3$ ක නියැදියක්, ආසුත ජලය එකතු කිරීමෙන් 1.00dm$^3$ තෙක් තනුක කරන ලදි. ඉහත (i) කොටසෙහි ලබාගත් ප්‍රකාශනය ආධාරයෙන්, මෙම අම්ල ද්‍රාවණයෙහි $P^H$ සඳහා ප්‍රකාශනයක් ලියන්න.

iv) ඉහත (i) සහ (iii) කොටස්වල ලබාගත් පිළිතුරු භාවිත කර, අම්ල ද්‍රාවණ දෙකෙහි $P^H$ අගයවල වෙනස $P^H$ ඒකක 0.5 ක් බව පෙන්වන්න.

v) ඉහත (i) කොටසෙහි අම්ල ද්‍රාවණයෙන් 220.0cm$^3$ ක් සහ සාන්ද්‍රණය c moldm$^{-3}$ වන NaOH ද්‍රාවණයකින් 20.0cm$^3$ ක් මිශ්‍ර කර සදා ගන්නා ද්‍රාවණයේ $P^H$ ගණනය කරන්න. **(2012 A/L)**

37. සංතෘප්ත $Mn(OH)_2$ ද්‍රාවණයක $25^0C$ හිදී $Mn^{2+}$ සාන්ද්‍රණය $0.1 \times 10^{-5}$ $moldm^{-3}$ වේ. $25^0C$ හිදී $Mg(OH)_2$ හි ද්‍රාව්‍යතා ගුණිතය $1.0 \times 10^{-10} mol^3dm^{-9}$ වේ. $25^0C$ හිදී $NH_4OH$ හි $K_b$ අගය $1.6\times 10^{-5}$ $moldm^{-3}$ වේ.

- i) $25^0C$ හිදී $Mn(OH)_2$ ද්‍රාව්‍යතා ගුණිතය ගණනය කරන්න.
- ii) $25^0C$ හිදී සාන්ද්‍රණය 0.01 $moldm^{-3}$ වූ $NH_4OH$ ද්‍රාවණයක හයිඩ්‍රොක්සයිඩ් අයන සාන්ද්‍රණය ගණනය කරන්න.
- iii) සාන්ද්‍රණය 0.1 $moldm^{-3}$ වූ $MnSO_4$ ද්‍රාවණයකින් $Mn(OH)_2$ අවක්ෂේප වීම පටන් ගැන්ම සඳහා අවශ්‍ය $NH_4OH$ සාන්ද්‍රණය නිර්ණය කරන්න.
- iv) සාන්ද්‍රණය 1.00 $moldm^{-3}$ වූ $NH_4OH$ ද්‍රාවණයක $1.00dm^3$ පරිමාවක් තුළ $NH_4Cl$, 5.35g දිය කර ඇත්නම් එම ද්‍රාවණයෙහි හයිඩ්‍රොක්සයිඩ් අයන සාන්ද්‍රණය ගණනය කරන්න.(H= 1.0, N=14.0, Cl= 35.5)
- v) $0.02moldm^{-3}$ $Mg(NO_3)_2$ ද්‍රාවණයක $0.50dm^3$ හා 0.20 $moldm^{-3}$ $NH^4OH$ ද්‍රාවණයක 0.50 $dm^3$ මිශ්‍ර කිරීමෙන් සෑදීමට යන ද්‍රාවණයක $Mg(OH)_2$ අවක්ෂේප වීම වැළැක්වීම සඳහා අවශ්‍ය වන ඝන $NH_4Cl$ මවුල සංඛ්‍යාව ගණනය කරන්න.
- vi) කාණ්ඩ විශ්ලේෂණයේ දී $NH_4Cl$ භාවිත කිරීම පැහැදිලි කරන්න. **(2013 A/L)**

38. Y යනු $25^0C$ හිදී $P^H$= 3.0 වූ HA දුර්වල අම්ලයෙහි 1.00 M ද්‍රාවණයකි. මෙම ද්‍රාවණයෙහි $100.0cm^3$ නියැදියක් සෙලවුම් බෝතලයක තබා කාබනික ද්‍රාවකයකින් $100.0cm^3$ එක් කරන ලදි. බෝතලය සෙලවීමෙන් පසු එය $25^0C$ හි ඇති ජල තටාකයක මිනිත්තු 30 ක් තබන ලදි. ඉන්පසු ස්ථර දෙක වෙන්කර ජලීය ස්ථරය Z ද්‍රාවණය ලෙස නම් කරන ලදි. Z ද්‍රාවණයෙහි $25.00cm^3$ නියැදියක් 0.50M NaOH සමඟ දර්ශකය ලෙස පිනොල්ප්තලීන් භාවිතකර අනුමාපනය කරන ලදි. අවශ්‍ය වූ NaOH පරිමාව 40.00 $cm^3$ වේ.

- i) $25^0C$ හිදී Y ද්‍රාවණයෙහි ඇති දුර්වල අම්ලයෙහි විඝටන ප්‍රමාණය $\alpha$ ගණනය කරන්න. Y ද්‍රාවණය සලකන්න.
- ii) $25^0C$ හිදී HA අම්ලයෙහි විඝටන නියතය ($K_a$) ගණනය කරන්න.
- iii) $25^0C$ හිදී Z ද්‍රාවණයෙහි ඇති HA අම්ලයෙහි විඝටන ප්‍රමාණය $\alpha$ ගණනය කරන්න.
- iv) ඉහත ගණනය කරන ලද $\alpha$ හා $\alpha'$ අගයන් භාවිතයෙන් $25^0C$ හිදී HA අම්ලයෙහි විඝටන ප්‍රමාණය හා සාන්ද්‍රණය අතර සම්බන්ධය පිළිබඳ අදහස් දක්වන්න.
- v) $25^0C$ හිදී ජලය හා කාබනික ද්‍රාවකය අතර HA අම්ලයෙහි විභාග සංගුණකය ගණනය කරන්න. (දුර්වල අම්ලය HA කාබනික ද්‍රාවකයක් තුළ සංඝටනය වීමක් හෝ විඝටනය වීමක් හෝ සිදු නොවේ. ජලීය මාධ්‍යයේ දී HA හි විඝටනය නොසලකා හරින්න)
- vi) Y ද්‍රාවණයෙන් $25.00cm^3$ හා 0.50M NaOH ද්‍රාවණයෙන් $25.00cm^3$ අඩංගු මිශ්‍රණයක $P^H$ අගය ගණනය කරන්න. **(2014 A/L)**

39. i. දුබල අම්ලයක් වන HA(aq) , NaOH ද්‍රාවණයක් සමඟ අනුමාපනය කිරීමේදී $A^-_{(aq)}$ හි ජල විච්ඡේදනය සැලකීමෙන් සමකතා ලක්ෂ්‍යයේදී ද්‍රාවණයේ pH අගය $pH = \frac{1}{2}pK_w + \frac{1}{2}pK_a + \frac{1}{2}log\ [A^-(aq)]$ මගින් ලබා දෙන බව පෙන්වන්න **(2015 A/L)**

(ඔබට $pH + pOH = pK_a + pK_b = pK_w$ සහ $K_b) = \frac{[OH^-(aq)][HA(aq)]}{[A^-(aq)]}$ බවදී ඇත.

ii. $1\times 10^{-3}$ $moldm^{-3}$HA(aq) ද්‍රාවණයක් $1 \times 10^{-3}$ $mol\ dm^{-3}$ NaOH ද්‍රාවණයක් සමඟ අනුමාපනය කිරීමේදී සමකතා ලක්ෂ්‍යයේදී pH අගය ගණනය කරන්න. ($K_a = 1.8 \times 10^{-5}$ $moldm^{-3}$)

සමකතා ලක්ෂ්‍යයේදී $[A^+(aq)] = (1\times10^{-3}/2)$ $moldm^{-3}$ (පරිමාව දෙගුණ වේ)

iii. සාන්ද්‍රණය $2\times10^{-3}$ $moldm^{-4}$ වන $Y^+_{(aq)}$ ද්‍රාවණ 500. 00 $cm^3$ ක් සාන්ද්‍රණය $2 \times 10^{-3}$ $moldm^{-3}$ වන HA(aq) ද්‍රාවණ 500. 00$cm^3$ කට එකතු කරන ලදි. YA(s) අවක්ෂේප කිරීම සඳහා මෙම ද්‍රාවණයට ඝන NaA සෙමින් ($K_{ap}(YA) = 1.80\times 10^{-7}\ mol^2dm^{-6}$)

40. $25^0C$ හි දී පරිමාමිතික ප්ලාකුවක් තුළ සංශුද්ධ දුබල අම්ලයකින් සුදුසු ප්‍රමාණයක් $25.00cm^3$ දක්වා ආසුත ජලයෙන් තනුක කිරීමෙන් HA දුබල අම්ලයෙහි $0.10\ moldm^{-3}$ ද්‍රාවණයක් සාදා ගන්නා ලදී. මෙම ද්‍රාවණයේ pH අගය 3.0 ක් විය.

i) $HA(aq) + H_2O(l) \rightleftharpoons H_3O^+(aq) + A^-(aq)$ යන සමීකරණය සලකමින් දුබල අම්ලයේ විඝටන නියතය $K_a$ ගණනය කරන්න.

ii) මෙම HA දුබල අම්ලයෙහි තනුක ද්‍රාවණයක්, BOH ප්‍රබල භස්මයක් සමඟ අනුමාපනය කරන ලදී, සමකතා ලක්ෂ්‍යය ළඟා වූ පසු අනුමාපනය මිශ්‍රණයේ pH අගය 9.0 බව සොයා ගන්නා ලදි. අනුමාපන මිශ්‍රණයේ ඇති AB ලවණයෙහි සාන්ද්‍රණය ගණනය කරන්න. ($25^0C$ දී $K_w = 1.0 \times 10^{-14}\ mol^2dm^{-6}$)

iii) ඉහත අනුමාපන මිශ්‍රණය අසුත ජලය එක් කිරීමෙන් සියවරක් තනුක කරන ලදි. තනුක කරන ලද අනුමාපන මිශ්‍රණයේ pH අගය ගණනය කරන්න. (2016 A/L)

41. ඕනෑම ජලීය ද්‍රාවණයක් තුළ $H_2O(l) \rightleftharpoons H^+(aq) + OH^-(aq)$ යන සමතුලිතතාව පවතී.

i) ජලයේ අයනික ගුණිතය $K_w$ සඳහා ප්‍රකාශනයක් ලියන්න.

ii) ඕනෑම ජලීය ද්‍රාවණයක් සඳහා $pH + pOH = pK_w$ බව පෙන්වන්න.

iii) ජලීය ද්‍රාවණයේ දී BOH ඒක ආම්ලික දුබල භෂ්මයකි. සාන්ද්‍රණය $C\ mol\ dm^{-3}$ වන BOH ද්‍රාවණයක $25^0C$ දී pH අගය $pH = 14 - \frac{1}{2}\ pK_b + \frac{1}{2}\ \log C$ මගින් ලබාදෙන බව ව්‍යුත්පන්න කරන්න. මෙහි $K_b$ යනු BOH හි භෂ්ම අයනීකරණ නියතය වේ.

iv) $25^0C$ දී සාන්ද්‍රණය $0.1\ mol\ dm^{-3}$ BOH ද්‍රවණයක pH අගය ගණනය කරන්න. (BOH හි $K_b = 1 \times 10^{-5}\ mol\ dm^{-3}$)

42. $25^0C$ උෂ්ණත්වයේ පවතින $CH_3COOH$ ද්‍රාවණයක සාන්ද්‍රණය $0.01moldm^{-3}$ $CH_3COOH$ වල Ka අගය $1 \times 10^{-6}\ moldm^{-3}$ වේ නම් අම්ලයේ pH අගය ගණනය කරන්න. $CH_3COO^-$ සාන්ද්‍රණය ගණනය කරන්න.

43. $25^0C$ උෂ්ණත්වයේදී $0.1\ moldm^{-3}$ වන HR ද්‍රාවයක් සලකන්න. මෙම ද්‍රවණයේ $K_a$ අගය $1{\times}10^{-7}\ moldm^{-3}$ වේ.

i). අම්ලයේ විඝටන ප්‍රමාණය ($\propto$) සොයන්න.

ii). අම්ලයේ සමතුලිත විට ඇති $H_3O^+$ සාන්ද්‍රණය සොයන්න.

iii). අම්ලයේ සමතුලිත විට ඇති $F^-$ සාන්ද්‍රණය සොයන්න.

iv). අම්ලයේ විඝටන ප්‍රතිශතය ගණනය කරන්න.

v). අම්ලයේ pH අගය ගණනය කරන්න.

44. $25C^0$ දී $0.001mol\ dm^{-3}$ $CH_3COOH$ ද්‍රාවණයක pH අගය ගණනය කරන්න. (Ka - $1 \times 10^{-5}\ moldm^{-3}$)

45. pH අගය 3.2 වන ඒක භාෂ්මික දුබල අම්ල ද්‍රවණයක සාන්ද්‍රණය $0.1\ moldm^{-3}$ වේ නම් එහි Ka අගය සොයන්න.

46. $2 \times 10^{-2}\ moldm^{-3}$ සාන්ද්‍රණයකින් යුත් $CH_3COOH$ ද්‍රාවණයක Ka අගය $1 \times 10^{-5}\ moldm^{-3}$ වේ. මෙම ද්‍රවණයේ

i). සමතුලිත විට ඇති $H^+$ සාන්ද්‍රණය සොයන්න.

ii). සමතුලිත විට ඇති $CH_3COO^-$ සාන්ද්‍රණය සොයන්න.

iii). සමතුලිත විට ද්‍රවණයේ pH අගය සොයන්න.

47. $0.4\ mol\ dm^{-3}$ ක් වන $HNO_3$ ද්‍රාවණයකින් $100\ cm^3$ ක් සමඟ $0.4\ mol\ dm^{-3}$ ක සාන්ද්‍රණයකින් යුත් $CH_3COOH$ ද්‍රාවණයකින් $100\ cm^3$ ක් එකිනෙකට මිශ්‍ර කරවූ විට සෑදෙන ද්‍රාවණයේ pH අගය ගණනය කරන්න. ($Ka=1\times 10^{-5} moldm^{-3}$) $CH_3COO^-$ සාන්ද්‍රණය ගණනය කරන්න.

48. $25^0C$ දී HF සහ HCN යන අම්ලවල විඝටන නියත පිළිවෙලින් 6.8x $10^{-4}$ $moldm^{-3}$ සහ 4.9 x $10^{-10}$$moldm^{-3}$ වේ. $25^0C$ දී HF වලට සාපේක්ෂව සාන්ද්‍රණය 0.50 $moldm^{-3}$ වු ද, HCN වලට සාපේක්ෂව සාන්ද්‍රණය 0.20 $moldm^{-3}$ වු ද, ජලීය ද්‍රාවණයක pH අගයත්, එහි අඩංගු වන $F^-$(aq) සහ $CN^-$(aq) අයන සාන්ද්‍රණත් සොයන්න.

49. 25 $^0C$ උෂ්ණත්වයේ දී 0.02 mol $dm^{-3}$ ක් වන සෝඩියම් ඇසිටේට් ($CH_3COONa$) ද්‍රාවණයක 100 $cm^3$ ක් සමඟ 0.04 mol $dm^{-3}$ ක් වන $CH_3COOH$ අම්ලය 100 $cm^3$ ක් එකිනෙකට මිශ්‍ර කරලීමෙන් සෑදෙන ද්‍රාවණයේ pH අගය ගණනය කරන්න. Ka = 1 x $10^{-6}$ mol $dm^{-3}$ වේ.

50. 0.04 mol $dm^{-3}$ ක් වන $CH_3COONa$ ද්‍රාවණයක 0.2 mol $dm^{-3}$ ක් වන $CH_3COOH$ අම්ලය අන්තර්ගත වේ. මිශ්‍රණයේ pH අගය ගණණය කරන්න. Ka = 1.8 x $10^{-5}$ mol $dm^{-3}$ වේ.

51. 25 $^0$ C හි දී 0.2 mol $dm^{-3}$ ක් වන HF අම්ලයේ 60 $cm^3$ ක් NaCH ද්‍රාවණයක 0.2 mol $dm^{-3}$ ක් වන ද්‍රාවණයෙන් 20 $cm^3$ ක් සමඟ එකිනෙකට මිශ්‍ර කරලීමෙන් සෑදෙන ජලීය ද්‍රාවණයේ pH අගය ගණනය කරන්න.
(1.8 x $10^{-5}$ mol $dm^{-3}$)

52. 298K දී 0.02 mol $dm^{-3}$ HCl ද්‍රාවණ $250cm^3$ කට $CH_3COO^-K^+$ 0.04mol එක්කර හොදින් මිශ්‍ර කරනු ලැබේ. එම මිශ්‍රණයේ PH අගය සොයන්න.

53. 25 $^0C$දී HF සහ HCN අම්ලවල විඝටන නියත පිළිවෙලින් 6.8 x $10^{-4}$ mol $dm^{-3}$ සහ 4.9 x $10^{-10}$ mol $dm^{-3}$ වේ. 25 $^0C$ දී HF වලට සාපේක්ෂව සාන්ද්‍රණය 0.2 mol $dm^{-3}$ වූ ද HCN වලට සාන්ද්‍රණය 0.1 mol $dm^{-3}$ ජලීය ද්‍රාවණයක pH අගයත් එහි අඩංගුවන $F^-$(aq) සහ $CN^-$(aq) අයන සාන්ද්‍රණත් සොයන්න.

54. සල්ෆර් ඩයොක්සයිඩ් වායුව ජලයේ දියකළ විට සල්ෆියුරස් අම්ල ද්‍රාවණයක් සෑදේ. එහි $Ka_1$=1.3 x $10^{-2}$$moldm^{-3}$ සහ Ka = 6.3 x 10-8 $moldm^{-3}$ වේ. 0.25 mol $dm^{-3}$ සල්ෆියුරස් අම්ල ද්‍රාවණයක pH අගය $SO_3^{2-}$ අයන සාන්ද්‍රණය ද සොයන්න.

55. $25^0C$ දී 0.1 $moldm^{-3}$ වන ජලීය $NH_3$ ද්‍රාවණයක Kb අගය 1 × $10^{-5}$ $moldm^{-3}$ වේ. මෙම සමතුලිත ද්‍රවණයේ,
   i). විඝටන ප්‍රමාණය සොයන්න.
   ii). සමතුලිත විට ඇති $H_3O^+$ සාන්ද්‍රණය සොයන්න.
   iii). සමතුලිත විට ඇති $NH^+_4$ සාන්ද්‍රණය සොයන්න.
   iv). සමතුලිත විට pH අගය සොයන්න.
   v). සමතුලිත විට භෂ්මයේ විඝටන එන්තැල්පිය සොයන්න.

56. $25^0C$ දී 0.01 වන ජලීය ඒක ආම්ලික දුබල භෂ්ම ද්‍රාවණයක pH අගය සොයන්න.

57. 4.2 × $10^{-12}$ $moldm^{-3}$ සාන්ද්‍රණයකින් යුත් $Na_4OH$ ද්‍රාවණයක Kb අගය 1 × $10^{-5}$ $moldm^{-3}$ වේ. මෙම ද්‍රවණයේ,
   i). සමතුලිත විට $OH^-$ සාන්ද්‍රණය සොයන්න.
   ii). සමතුලිත විට ඇති $NH^+_4$ සාන්ද්‍රණය සොයන්න.
   iii). සමතුලිත විට ද්‍රවණයේ pH අගය සොයන්න.

58. $25^0C$ දී ඒක ආම්ලික දුබල භෂ්මයක pH අගය 11.2 වේ.මෙම ද්‍රවණයේ සාන්ද්‍රණය $3.2 \times 10^{-2}$ mol $dm^{-3}$ වේ නම් භෂ්මයේ Kb අගය ගණනය කරන්න.

59. $25^0C$ හිදී 0.2 mol $dm^{-3}$ ක් වන ජලීය $NH_4OH$ ද්‍රාවණයක pH අගය ගණනය කරන්න. ($Kb = 1 \times 10^{-4}$ mol $dm^{-3}$ වේ. / $Kw = 1 \times 10^{-14}$ mol $dm^{-6}$ වේ.) ස.වි. ($NH_4^+$) සොයන්න.

60. 25 $^0C$ හි දී $NH_4OH$ ජලීය ද්‍රාවණයක pH අගය 8.4 ක් වේ. විඝටන ප්‍රමාණය නිර්ණය කරන්න.
සමතුලිතවීම ඇති ($OH^-$) නිර්ණය කරන්න. ආරම්භක $NH_4OH$ කිසියම් ස්කන්ධයක් 100 $cm^3$ ක ද්‍රවණය කර මෙම ද්‍රාවණය සකසා ඇත්නම් එකතු කළ ස්කන්ධය ගණනය කරන්න

61. 290 K හි දී 0.1 mol $dm^{-3}$ ක් වන NaOH ද්‍රාවණයක මිශ්‍ර වී පවතින 0.01 mol $dm^{-3}$ ක් වන මෙතිල් ඇමීන් අඩංගු ද්‍රාවණයේ ($CH_3NH_2$) pH අගය කරන්න. ($Kb = 1 \times 10^{-9}$ mol $dm^{-3}$)

62. 298 K හි දී 0.3 mol $dm^{-3}$ ක් $H_2SO_4$ ද්‍රාවණයකින්5.0 $cm^3$ කට 0.6 mol $dm^{-3}$ ක් වන $NH_4OH$වලින් 50 $cm^3$ ක් එකතු කරයි. පරිමා විපර්යාසයක් නොවුනේ නම් pH අගය සොයන්න. $Kb = 1.8 \times 10^{-5}$

63. 25 $^0C$ දී 0.050 mol $dm^{-3}$ ජලීය ඇමෝනියා ද්‍රාවණයකට ඝන $NH_4Cl$ යම් ප්‍රමාණයක් එක් කර හොඳින් මිශ්‍ර කරයි. මිශ්‍රණයේ ඇති $NH_4^+$ සාන්ද්‍රණය 0.10 mol $dm^{-3}$ නම් මිශ්‍රණයේ ඇති $OH^-$ සාන්ද්‍රණය සොයන්න. $K_b(NH_3) = 1.75 \times 10^{-5}$ mol $dm^{-3}$

